**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය.**

**පෙර පාසල් අධ්‍යාපන උසස් සහතික පත්‍ර වැඩ සටහන**

**අවසාන පරීක්ෂණය - 2008**

**ESC 2217- මුල් ළමාවියේ අධ්‍යාපනය පිළිබඳ සමාජ සංස්කෘතික සාධක**

**කාලය - පැය තුනයි.**

---

**දිනය - 2008 අගෝස්තු 29 වන දින** **වේලාව - පෙ.ව.09.30- ප.ව.12.30**

---

**පළමු කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, දෙවන කොටසේ ප්‍රශ්ණ තුනකට (03)පමණක් පිළිතුරු සපයන්න.**

## පළමු කොටස

01. ළමයින් පිළිබඳව පූර්ව කාර්මික යුගයේ සමාජය තුල පැවති මතයන් තුනක් (03) ක් සඳහන් කරන්න.

02. ළමයා පිළිබඳ නව සංකල්පය කුමක් ද?

03. ළමයින්ගේ ගැලවුම්කාරයා ලෙස සලකනු ලබන්නේ කවුද ? ඊට හේතුව කෙටියෙන් පැහැදිලි කරන්න.

04. ළමයාට යෝග්‍ය වූ ඉගෙනුම් වාතාවරණයක් සැපයීමෙහි ලා මාරියා මොන්ටිසෝරි වෛද්‍යතුමියගේ දායකත්වය ගැන කෙටියෙන් විස්තර කරන්න.

05. දරුවා තුල ධනාත්මක ස්වසංකල්පය ගොඩනංවාලීමට පවුලේ සාමාජිකයින්ට ගත හැකි ක්‍රියාමාර්ග කෙටියෙන් පැහැදිළි කරන්න.

06. "පවුල" යනු කුමක් ද? න්‍යෂ්ටික පවුල හා විස්තෘත පවුල අතර ඇති වෙනස කෙටියෙන් පහදන්න.

07. බාලවියේ ළමයින් රූපවාහිනී නාට්‍ය (Teledrama) නැරඹීමේ වාසි දෙකක් (02)හා අවාසි දෙකක් (02) ක් සඳහන් කරන්න.

08. "හානි පූර්ණ අධ්‍යාපනය" යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 5 x 8 = 40 )

## දෙවන කොටස

09. වර්තමානයේ මොන්ටිසෝරි ක්‍රමය බොහෝ ජනප්‍රියව ඇති අතර පෙර පාසල් මොන්ටිසෝරි ලෙස ද හැඳින්වේ. මෙසේ මොන්ටිසෝරි ක්‍රමය හා එය අනුගමනය නොකරන පෙර පාසල අතර ඔබ දකින වෙනස පැහැදිලි කරන්න.
(ලකුණු 20)

10. i. සමාජානුයෝගය කුමක්දැයි නිර්වචනය කරන්න.
(ලකුණු 04)

ii. සමාජානුයෝගීකාරක 03 ක් කෙටියෙන් විස්තර කරන්න.
(ලකුණු 06)

iii. ළමයකුගේ සංවර්ධනයට තම නිවසේ පරිසරය බලපාන්නේ කෙසේදැයි පරීක්ෂා කරන්න. (ලකුණු 10)

11. i අවාසි සහගත පරිසරයක හැදෙන ළමයින්තුල දක්නට ලැබෙන ගැටළු 3 ක් විස්තර කරන්න. (ලකුණු 08)

ii. ඔබ ඉහත දැක්වූ ගැටළු නිරාකාරණය කර ගැනීමට ගුරුවරියක ලෙස මෙම ළමයින්ට ඔබට සහයවිය හැකි ආකාරය විස්තර කරන්න. (ලකුණු 12)

12. i. "ළමයා තුළ යහපත් සමාජ චර්යා ඇති කිරීම සඳහා මාධ්‍යයට කළ හැකි කාර්යය පැහැදිලි කරන්න. (ලකුණු 12)

ii. රූපවාහිනියට ඇබ්බැහිව නිතිපතා එය බලන ළමයින් ඉන් වෙනස් කිරීමට දෙමාපියන්ට කළ හැකි පියවරවල් ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

13. i. "ළමයින්ට සුහද, ලෙන්ගතු, පිළිගැනීමක් ඇති නිවසක ජීවත්වීම අත්‍යවශ්‍ය වේ." නිදසුන් දක්වමින් මෙම ප්‍රකාශය පැහැදිළි කරන්න.
(ලකුණු 10)

ii. මව්පියන්ගේ දික්කසාදය දරුවනට බලපාන ආකාරය කෙබඳුදැයි විග්‍රහ කරන්න.
(ලකුණු 10)

14. පහත දැක්වෙන මාතෘකා යටතේ කෙටි සටහන් ලියන්න.

i. සමාජ සංවර්ධනය සඳහා සමවයස් කණ්ඩායම් වල බලපෑම

ii, ශ්‍රී ලාංකික මව්වරුන් විදේශගතවීම ළමයා කෙරෙහි බලපාන අයුරු.
(ලකුණු 10 x 2 = 20)

- හිමිකම් ඇවිරිණි. -